G3

දිවයිනේ ජාතික හා පළාත් පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සඳහා රජයේ සේවයේ නියුතු හා රජයේ සේවයේ නියුතු නොවන උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-I (අ) ශ්‍රේණියට බඳවා ගැනීම - 2026

සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගිවීමට අදාළ උපදෙස්

01. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

1.1 මෙම සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබූ ඔබ, පහත සඳහන් සහතික/ලේඛනවල මුල් පිටපත් ගොනුවක් හා ඡායා පිටපත් (ඡායා පිටපත් තමා විසින් සහතික කර ඉදිරිපත් කළ යුතුය.) අමුණන ලද ගොනුවක් ද රැගෙන මේ සමඟ යොමු කර ඇති ලිපියේ 2 ඡේදයෙහි වගුවෙහි සඳහන් නියමිත වේලාවට විනාඩි 30කට පෙර සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානයට පැමිණිය යුතු බව කාරුණිකව දන්වමි.

I. ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය

II. උප්පැන්න සහතිකය (කෙටි උධෘත භාරගනු නොලැබේ. විවාහයෙන් පසු නම වෙනස් කර ඇත්නම් විවාහ සහතිකය ද සමඟ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුවේ.)

III. විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද අ.පො.ස.සාමාන්‍ය පෙළ විභාග සහතිකය (විභාග කොමසාරිස් ජනරාල් විසින් දේශීය හා විදේශීය අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය හා සමානව පිළිගනු ලබන විභාග සමතුන් විසින් ඒ බව සහතික කරන ලද විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද සහතිකය රැගෙන පැමිණීම අනිවාර්ය වේ.)

IV. වලංගු උපාධි සහතිකය හා උපාධියට හදාරා ඇති විෂයයන් ඇතුළත් සවිස්තරාත්මක ප්‍රතිඵල සටහන (Academic Transcript)

V.

(a) තමන් සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබා ඇති විෂයන්ට අදාළව ගැසට් පත්‍රයේ සඳහන් පරිදි විෂය හෝ/ විෂය සන්ධාරය (1/3) තහවුරු කිරීම සඳහා අදාළ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී හෝ ලේඛකාධිකාරී විසින් බලය පවරන ලද නිලධාරියෙකු වෙතින් සහතික කරන ලද F1 ආකෘතිය

(b) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙහි පහත දක්වන ලද දිගු ඔස්සේ දක්වනු ලබන F1 ආකෘතිය ඉදිරිපත් කළ යුතු ආයතන / විශ්වවිද්‍යාලවලට අයත් නොවන, වෙනත් දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාල/ ආයතනවලින් උපාධිය ලබා ඇති අයදුම්කරුවන් තමන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීම් ලබා ඇති පළාතට අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා නිල වෙබ් අඩවිය මඟින් 2026.11.01 දින සිට 2026.11.07 දක්වා ප්‍රදර්ශනය කරනු ලබන ගූගල් පෝරමය (Google Form) පුරවා තම උපාධි සහතිකය සහ විස්තරාත්මක උපාධි සහතිකයේ පරිලෝකන පිටපත (Scanned Copy) යොමු කළ යුතු වේ. ඒ අනුව සම්මුඛ පරීක්ෂණයට පෙර මෙම අමාත්‍යාංශය විසින් පත්කරන ලද කමිටුවක් මඟින් පරිලෝකන

පිටපත අනුව විෂය සන්ධාරය පිළිබඳව අධ්‍යනය කොට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත එකී කම්ටු තීරණය යොමු කරනු ඇත. එබැවින් උක්ත ගූගල් පෝරමය මඟින් පරිලෝකන පිටපත් ඉදිරිපත් කළ සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ යුතුවේ.

<u>F1 ආකෘතිය ඉදිරිපත් කළ යුතු විශ්වවිද්‍යාල/ ආයතන:</u>

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට පිවිස එහි ප්‍රධාන මෙනුවෙහි, විශ්වවිද්‍යාල හා ආයතන වෙත යොමු වන ලෙසත්; ඒ යටතේ පහත පිළිවෙලින් පිවිස අදාළ විශ්වවිද්‍යාල/ආයතන පරීක්ෂා කරන ලෙසත් කාරුණිකව දන්වමි.

"විශ්වවිද්‍යාල" →

"මණ්ඩප" →

"වෙනත් පිළිගත් උපාධි" → 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 අ වගන්තිය යටතේ පිළිගත් ආයතනවල උපාධි

"බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා" →

"අනෙකුත් රජයේ විශ්වවිද්‍යාල" →

VI. ස්ථිර පදිංචිය සනාථ කිරීම සඳහා ග්‍රාම නිලධාරී සහතිකය හා ඡන්ද හිමි නාම ලේඛනයේ උධෘතය **(සැ.යු:- ඡන්ද හිමි නාම ලේඛනයේ උධෘතය - මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියට පිවිස ඡන්ද හිමි නාම ලේඛනයේ උධෘතය ලබා ගැනීම ප්‍රමාණවත් වේ.)**

VII. ඔබ විසින් ඉදිරිපත් කරනු ලබන සහතිකවල නමේ වෙනස්කම් පවතී නම් ඊට අදාළව දිවුරුම් ප්‍රකාශ

VIII. පූර්ණකාලීන ආබාධිත අයදුම්කරුවෙකු ලෙස විභාගයට පෙනී සිට සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් ලද අයදුම්කරුවන්, මෙම අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කර ඇති F2 ආකෘතිය අදාළ රෝහල වෙත ඉදිරිපත් කර, වෛද්‍ය පරීක්ෂණ මණ්ඩල විසින් සහතික කරන ලද එම ආකෘතිය (පූර්ණකාලීන ආබාධිත අය හට අදාල රෝහල වෙත පැමිණිය යුතු වේලාව; එකී අයදුම්කරුවන් අයදුම්පත්‍රය සමඟ යොමු කර ඇති දුරකතන අංකය වෙත දුරකතන මාර්ගයෙන් දැනුම්දීමට 2026.11.01 – 2026.11.07 කාලය තුළ මෙම අමාත්‍යාංශය විසින් කටයුතු කරනු ඇත.)

IX. පොලිස් ස්ථානය වෙතින් ලබාගත් ඔබගේ ඇඟිලි සලකුණුවලට අදාළ පොලිස් නිශ්කාෂණ වාර්තාව (පොලිස් නිශ්කාෂණ වාර්තාව ලබාගැනීමට අදාළව අමාත්‍යාංශ වෙබ් අඩවියේ සඳහන් F3 ආකෘතිය හා උපදෙස් පරිදි) - අංක 2476/18 හා 2026.02.18 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය මගින් සංශෝධිත අංක 2474/19 හා 2026.02.02 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය අනුව අයදුම් කළ සියලුම අයදුම්කරුවන්ට පමණක් අදාළ වේ.

X. ගැසට් පත්‍රයේ සටහන 4/ 6 ප්‍රකාරව ඔබ සුදුසුකම් ලබන විෂයන්ට අදාළව උක්ත Vහි දක්වා ඇති උපාධි සහතිකයට අමතරව වෙනත් සහතික ඉදිරිපත් කළයුතු අවස්ථාවලදී එම සහතික

XI. ඔබ වෙත තැපැල් මගින් යොමු කරනු ලබන කැඳවීම් ලිපිය සමඟ වන G5 ලේඛනයේ දක්වන පරිදි පාසල් වරණයන් ඇතුලත් ලේඛනයේ මුද්‍රිත පිටපත

XII. විභාගයට අයදුම් කර යොමු කළ රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් දිවුරුම් ප්‍රකාශයක් සමඟ ඉහත ලේඛනවලට අමතරව අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පල කර ඇති F4 ලෙස දක්වන ලද ආකෘතිය පරිදි සේවයේ සනාථ කිරීමේ සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි. (අංක 2474/18 හා 2026.02.02 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ සටහන 1 හෝ අංක 2474/19 හා 2026.02.02 දිනැති ගැසට් පත්‍රයේ සටහන 3 මගින් ආවරණය වන අයදුම්කරුවන්)

ඉහත දක්වා ඇති සියලුම ලේඛනවල මුල් පිටපත් **<u>සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ දිනයේදී ම ඉදිරිපත් කළ යුතු අතර පසුව ඉදිරිපත් කරනු ලබන ලේඛන භාර ගනු නොලැබේ.</u>**

ඉතා වැදගත් : තවද මෙම සියලු සහතික වල ඡායා පිටපත් ගොනුවක් ඔබගේ සම්පූර්ණ නම / ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කර රැගෙන ආ යුතු අතර, එම සෑම ලේඛනයක්ම ඔබ විසින්ම අත්සන් යොදා සත්‍ය පිටපත් බව සහතික කර, ඉහත 1.1හි දක්වා ඇති අනුපිළිවෙලට ලේඛන දක්වමින් දිවුරුම් ප්‍රකාශයක් (වෙබ් අඩවියේ දක්වා ඇති F5 ආකෘතිය) මඟින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු වේ. (එහිදී එකී ගොනුවෙහි ඉහත 1.1හි V(a), VII, VIII, IX, X,XI හා XII ලෙස දක්වන ලද ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් නැවත ලබා දෙනු නොලබන බැවින් අවශ්‍යනම්, ඒවායේ ඡායාපිටපතක් ළඟ තබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම මැනවි.)

ඔබ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවකු නම්, එදිනම පැවැත්වෙන ගැසට් පත්‍රයෙහි 10.3 ඡේදයෙහි සඳහන් ප්‍රායෝගික පරීක්ෂණයට ද යොමු කරනු ලබන බැවින් ඒ සඳහා ද සුදානම්ව පැමිණීම අවශ්‍ය වේ.

(මෙම සාමාන්‍ය හා ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වෙන පරිශ්‍ර වෙත ගමන් මළු, ජංගම දුරකථන රැගෙන යාමට ඉඩකඩ ලබා නොදෙන බව සලකා කටයුතු කිරීම මැනවි.)

<u>02. ප්‍රායෝගික පරීක්ෂණය</u>

2.1. අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.3.4 වගන්තිය අනුව ශ්‍රී ලංකා ගුරු

සේවයේ 3-I (අ) ශ්‍රේණියට ගුරුවරුන් බඳවා ගැනීම සඳහා වන ප්‍රායෝගික පරීක්ෂණය සඳහා පහත පරිදි සූදානම්ව සහභාගී වන ලෙස කාරුණිකව දන්වමි.

2.2. මෙම පරීක්ෂණය ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ “ආ” පරිශිෂ්ටයට අනුව පහත පරිදි සිදු කෙරේ.

2.3. ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් ගැසට් නිවේදනයේ 10.3 සටහන 10 හි සඳහන් පරිදි හඳුනා ගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත පරිදි ලකුණු හිමි වේ. (මෙහිදී තමන් විෂයයන් කිපයක් සඳහා ප්‍රායෝගික පරීක්ෂණයට මුහුණ දීමට සුදුසුකම් ලැබුව ද, ඔබ අයදුම්පත් යොමු කළ ගැසට් නිවේදනයන්හි සටහන 10/ සටහන 13 පරිදි ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය. එම ඉදිරිපත් කිරීම්වලට අදාළව ලබා දෙන ලකුණු ඔබ සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබා ඇති සියලුම විෂයයන් සඳහා අදාළ කර ගනු ලැබේ. තවද, ප්‍රායෝගික සම්මුඛ පරීක්ෂණ මණ්ඩල තීරණය අයදුම්කරුවන් වෙත එම අවස්ථාවේදීම දැනුම් දෙනු නොලැබේ.)

අනු අංකය	ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය
1	අරමුණ හා ප්‍රවිෂ්ට වීම	05	02
2	පෞරුෂය හා හඬ පාලනය	05	02
3	සන්නිවේදනයේ පැහැදිලි බව	05	02
4	කාල කළමනාකරණය	05	02
5	ඉදිරිපත් කිරීමේ ශිල්පක්‍රම භාවිතය	05	02
මුළු ලකුණු ප්‍රමාණය		**25**	**10**

2.4. ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය (අයදුම්පත් කැඳවන ලද ගැසට් නිවේදනයේ 10.3 පරිච්ඡේදය අනුව සිදු කරනු ලබයි.)

I. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා විනාඩි 5කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.

II. ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහ (25) කි.

III. ප්‍රායෝගික පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතුය.

2.5. ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබා දීමේදී සලකා බලන නිර්ණායකයන්හි අරමුණ

I. අරමුණ හා ප්‍රවිෂ්ට වීම
සාර්ථකව පාඩමෙහි අරමුණ පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම

II. පෞරුෂය හා හඬ පාලනය
ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දි මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම

III. සන්නිවේදනයේ පැහැදිලි බව

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ කරුණු ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම

IV. කාල කළමනාකරණය

ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ළගා වීමේ කුසලතාවය ඇගයීම

V. ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය

අරමුණ කෙරෙහි ළගා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව ඇගයීම

2.6. ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන් විසින්, ඔබ අයදුම් කළ ගැසට් පත්‍රයේ සටහන 4/ 6 හි දක්වා ඇති විෂයයන් කිහිපයකට සුදුසුකම් ලබා ඇත්නම් එකී සියලු විෂයන්ට අදාළ ඉදිරිපත් කිරීම් ප්‍රායෝගික පරිකෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට සූදානම්ව පැමිණීමට වගබලා ගත යුතු අතර ගැසට් පත්‍රයන්හි සටහන 10/ 13 පරිදි ඉදිරිපත් කිරීම සිදු කළ යුතුය.

3. උක්ත සඳහන් ගැසට් පත්‍රය ප්‍රකාරව හා අමාත්‍ය මණ්ඩලය මඟින් ලද තීරණයන් ප්‍රකාරව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවය පරිදි මෙම සම්මුඛ පරීක්ෂණ සඳහා වන කැඳවීම් ලිපි අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් හෝ බලය පවරන ලද නිලධාරියෙකු විසින් හෝ නිකුත් කරනු ලබන බැවින්, එකී සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවන දිනය/වේලාව තුළ නියමිත ස්ථානය වෙත පැමිණිය යුතු අතර, නියමිත පරිදි සම්මුඛ පරීක්ෂණයට සහභාගී නොවී ඒ සඳහා වෙනත් දිනයක් හෝ වේලාවක් ලබා ගැනීම සම්බන්ධයෙන් කරනු ලබන ඉල්ලීම් කිසිඳු හේතුවක් මත සලකා නොබලන බවද දන්වමි.

4. **ඔබ උක්ත සඳහන් ගැසට් පත්‍රය ප්‍රකාරව සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් තීරණය කරන අවස්ථාවේදී, එකී තීරණය අවසන් තීරණය ලෙස සලකා කටයුතු කරනු ලැබේ.**

5. මෙම පරීක්ෂණවලට සහභාගී වීම සඳහා ගමන් වියදම් හෝ උපවේශන දීමනා කිසිවක් ගෙවනු නොලැබේ.

6. මෙම ප්‍රායෝගික පරීක්ෂණයට අවශ්‍ය පහසුකම් ලෙස (White Board, Marker Pen, Pins, Dusters) **<u>පමණක්</u>** ප්‍රායෝගික පරීක්ෂණ මණ්ඩලය විසින් සපයා දෙනු ලබන අතර, ඔබ විසින් ඉදිරිපත් කිරීම සඳහා බිස්ට්ල් බෝඩ්/ සටහන් භාවිතා කිරීමට අපේක්ෂා කරයි නම් එම ද්‍රව්‍ය පෞද්ගලිකව සපයා ගත යුතු අතර, එම බිස්ට්ල් බෝඩ්/ සටහන් නිර්මාණය කිරීම සඳහා අමතර කාලයක්/ ස්ථානයක් ලබාදීමක් සිදුනොකරන බැවින්, ඒවා සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන අවස්ථාව වන විට සකස් කරගෙන පැමිණීමට වගබලා ගතයුතුය.

නාලක කලුවැව

ලේකම්